*__2016.05.23 වන දින බම්බලපිටිය මුස්ලිම් බාලිකා විද්‍යාලයේ පැවැති වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවයේ ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගී වෙමින් අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා කළ කතාව.__*

වසර 13 ක් අනිවාර්ය අධ්‍යාපනය ලැබීම සඳහා අධ්‍යාපන ක්‍රමයක් අප ඇති කර තිබෙනවා. මුස්ලිම් කාන්තා විද්‍යාලය වැනි පාසල්වල සිසුනට නම් අනිවාර්යෙන්ම වසර 13 ක අධ්‍යාපනයක් ලැබෙනවා. මේ ආසන්නයේ ඇති හින්දු කාන්තා විද්‍යාලය, විශාඛා විද්‍යාලය, රාජකීය විද්‍යාලය, ආනන්ද විද්‍යාලය, ඩී.එස්. සේනානායක විද්‍යාලය වැනි පාසල්වලත් සම්පූර්ණ අධ්‍යාපනයක් ලැබෙනවා. නමුත් රටේ බහුතර පාසල් සංඛ්‍යාවක එම වසර 13 ක සම්පූර්ණ අධ්‍යාපනය ලැබෙන්නේ නැහැ.

මෛත්‍රීපාල සිරිසේන මහතා යටතේ ඇති කළ ජාතික ආණ්ඩුවට අධ්‍යාපන ක්‍රමය සම්බන්ධයෙන් නව ප්‍රතිපත්තියක් තිබෙනවා. ශ්‍රී ලංකාවේ ප්‍රධාන පක්ෂ සියල්ලම එම ප්‍රතිපත්තියට සහයෝගය ලබා දෙනවා. අධ්‍යාපනය දේශපාලන ක්‍රීඩාවක් බවට පත් නොකර අධ්‍යාපන ක්‍රමයේ ඇති අඩුපාඩු හඳුනාගෙන ඒවා සකසා ඉදිරියට යාම ජාතික රජයේ අරමුණයි.

මා මෙහි පැමිණීමට පෙර අධ්‍යාපන අමාත්‍යවරයා සමග සාකච්ඡා කොට වත්මන් අධ්‍යාපනය සංඛ්‍යා ලේඛණ ගෙන්වා ගත්තා. එම සංඛ්‍යා ලේඛණ අධ්‍යයනය කිරීමෙන් පාසල් අධ්‍යාපනය ලබන සංඛ්‍යාව පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකියි.

2000 වසරේදී සිසු සිසුවියන් තුන් ලක්ෂ තිස් එක්දාහස් හයසිය හැටතුනක් පළමු වසරට ඇතුළු වුණා. වසර 11 ක් ගත වී සාමාන්‍ය පෙළ විභාගය වන විට පනස් නව දහසක් පමණ අධ්‍යාපනය හැර ගොස් තිබුණා. සාමාන්‍ය පෙළ විභාගයෙන් පසුව එක් ලක්ෂ දහසය දහසක් පාසල් අධ්‍යාපනය ලැබීමෙන් ඉවත් වී තිබුණා. සාමාන්‍ය පෙළ විභාගයට ඉදිරිපත් වූ ඉතිරි සිසුන්ගෙන් 50% කට වත් උසස් අධ්‍යාපනය ලැබීමට අවස්ථාව ලැබුණේ නැහැ. එම අවස්ථාව ලැබුණේ ස්වල්ප දෙනෙකුට පමණයි. එසේ නම් 50% කට වැඩි පිරිසකට අධ්‍යාපනය ලැබෙන්නේ නැහැ. අප වැනි රටක එවැනි විශාල ප්‍රතිශතයකට අධ්‍යාපනය නොලැබී යාම විශාල අපරාධයක් බව කිව යුතුයි. එය විශාල මිනිස් සම්පතක් අපතේ යෑමක් වශයෙන් හැඳින්විය හැකියි.

සම්පූර්ණ අධ්‍යාපනයක් ලබා දුනහොත් සමාජයෙන් අපට මීට වඩා හොඳ ප්‍රතිඵලයක් ලබා ගත හැකියි. ඒ නිසා අප මේ තත්ත්වයට දැන් මුහුණ දිය යුතුයි. අප නිදහස් අධ්‍යාපනයක් පිළිබඳව කතා කරනවා නම්, එක් කාරණයක් සිහියේ තබා ගත යුතුයි. අප ඒ යුතුකම 100% යක් ඉටු කරන්නේ නැහැ. රජයේ පාසල්වලට අමතරව පෞද්ගලික පාසල්වලට යන ශිෂ්‍ය සංඛ්‍යාව අඩු කළහොත් මේ ප්‍රතිඵලය මීට වඩා අසාර්ථක වනවා. සාමාන්‍යයෙන් පෞද්ගලික පාසල්වල විභාග ප්‍රතිඵල හොඳ මට්ටමක තිබෙනවා. අනතුර තිබෙන්නේ නිදහස් අධ්‍යාපනය ලබන සිසු සිසුවියන්ටයි.

අධ්‍යාපන අමාත්‍යාංශයත්, අපත් සාකච්ඡා කොට නව අධ්‍යාපන ප්‍රතිසංවිධාන වැඩ සටහන යටතේ පළමුවෙන්ම සිදු කරන්නේ වසර 13 ක අධ්‍යාපනය සෑම සිසුවෙකු සඳහාම ලබාදීමයි. එසේ නම් අප ඒ සඳහා වසර 13 ක් යනතුරු අධ්‍යාපනය අනිවාර්ය කළ යුතුයි. සිසුවකු හෝ සිසුවියක පාසල් නොගියහොත් ඔවුන් හට හෝ දෙමව්පියන්ට දඬුවම් කිරීමෙන් ප්‍රතිඵලයක් ලැබෙන්නේ නැහැ. ඔහු හෝ ඇය පාසල් නොයන්නේ මන්දැයි යන හේතුව අප සොයා බැලිය යුතුයි. අප ප්‍රතිකාර කළ යුත්තේ එම හේතුවටයි. සමහරවිට ආදායම් ප්‍රශ්නයක් විය හැකියි. ඇතැම්විට මාපියන් අතර ප්‍රශ්නයක් විය හැකියි. අප ඒ ප්‍රශ්නය දෙස බලා ඊට පිළියම් යෙදිය යුතුයි. ඒ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයට විශේෂ වගකීමක් තිබෙනවා.

සාමාන්‍ය පෙළ විභාගයෙන් විශාල පිරිසක් අසමත් වනවා. දෙවැනුව අප ඒ පිළිබඳව සොයා බැලිය යුතුයි. සාමාන්‍ය පෙළ විභාගයේ අවශ්‍ය කරන විෂයන්වලින් සමත් වන්නේ නැත්නම් ඒ අයට පාසලෙන් පිටවී යාමට සිදු වෙනවා. එම ක්‍රමය නැති කර සාමාන්‍ය පෙළ විභාගයෙන් පසුව සියලූ දෙනාටම වැඩිදුර අධ්‍යාපනය ලැබිය හැකි පරිදි අප නීති සම්පාදනය කරනවා. විශ්ව විද්‍යාලයට ඇතුළුවීමට අවශ්‍ය සිසු සිසුවියන්ට සාමාන්‍ය පෙළ විභාගයෙන් අවම සුදුසුකම් ලබා ගෙන උසස් පෙළ විභාගයෙන් නම් කළ විෂයන්වලින් සමත් විය හැකියි. අපගේ ජාතික රජයේ අධ්‍යාපන ප්‍රතිපත්තිය අනුව සාමාන්‍ය පෙළ විභාගයේ විෂයන් කිහිපයක් අසමත් වුණා යැයි සිසුන් උසස් අධ්‍යාපනය ලැබීමෙන් ඉවත් විය යුතු නැහැ.

මේ ක්‍රමය යටතේ සිසු සිසුවියන් වසර 13 ක් පාසලේ රඳවා ගැනීමට අපේක්ෂා කරනවා. නමුත් මේ විෂය මාලා ක්‍රමයෙන් පමණක් එය කළ නොහැකියි. විශ්ව විද්‍යාලයට පිවිසෙන අයට නම් මේ විෂය මාලා හොඳයි. ඒ නිසා සාමාන්‍ය පෙළ විභාගයේදී අමතර විෂය මාලා කිහිපයක් ඇතුළු කිරීමට ද අධ්‍යාපන අමාත්‍යාංශය තීරණය කර තිබෙනවා. උසස් පෙළ විභාගයටත් එවැනි විෂයන් කිහිපයක් ඇතුළු කිරීමට නියමිතයි.

එවිට සංගීතයට දක්ෂ අයට සංගීතය ඉගෙන ගත හැකියි. ක්‍රීඩාවට දක්ෂ අයට ක්‍රීඩා ඉගෙන ගත හැකියි. තමන්ට අවශ්‍ය නම් ගණිතය සහ ක්‍රීඩා ඉගෙන ගැනීමට හැකියාව තිබෙනවා. මේ යටතේ තමන් යන මාර්ගය තමන්ට තීරණය කරන්නට හැකියාව ලැබෙනවා. ඒවගේම අධ්‍යාපනය ලැබිය යුතු ආකාරය පිළිබඳව උපදෙස් දීමටත් අප කටයුතු කරනවා. අප ඉදිරියට යන්නේ ඒ ආකාරයටයි.

වර්තමානයේ ඩිජිටල් යුගයට පා තබා ඇති නිසා ඩිජිටල් තාක්ෂණයත් පාසල්වලට ගෙනෙන්නට කටයුතු කරනවා. ඒ පිළිබඳව අප වැඩිදුර සාකච්ඡා කරනවා. අනාගත අධ්‍යාපනය සඳහා තොරතුරු තාක්ෂණයත්, ඩිජිටල් දැනුමත් අත්‍යවශ්‍යයි. තව වසර 10 කින් අපගේ පාසල් වර්තමානයේ තිබෙන තත්ත්වයට වඩා සම්පූර්ණයෙන්ම වෙනස් වේවි.

සෑම සිසුවෙකුටම පාහේ වර්තමානයේ දී ජංගම දුරකථනයක් තිබෙනවා. එම ජංගම දුරකථනය මගින් ද තොරතුරු ලබා ගැනීමට හැකියාව තිබෙනවා. අප ඒ අයුරින් නව ක්‍රමවේදයකට ගමන් කළ යුතුයි.

එම ක්‍රමවේද පිළිබඳ අප සැලසුම් සකසමින් තිබෙනවා. ඒ සැලසුම් සකසන අතර අප තවත් කාරණා පිළිබඳව අවධානය යොමු කළ යුතුය. අනාගතයේදී පාසල් සිසුන් සංඛ්‍යාව තවත් ලක්ෂ 10 කින් පමණ වැඩි වේවි. එය මෙවැනි පාසල්වලට ප්‍රශ්නයක් නොවේ. නමුත් කුඩා පාසල්වලට එම අභියෝගයට මුහුණදීම සඳහා ඉඩකඩ සොයා ගත යුතුයි. එමෙන්ම ගුරුවරුන් තවත් බඳවා ගත යුතුයි. ඒ ගුරුවරු පුහුණු කිරීමේ වගකීම තිබෙනවා. ඒ වගේම විදුහල්පතිවරු පුහුණු කිරීමේ වගකීම තිබෙනවා. පාසල්වල මෙම නව වැඩසටහන් ක්‍රියාත්මක වනවා දැයි පරීක්ෂා කිරීම සඳහා වෙනම පරීක්ෂක පිරිසක් පැමිණෙනවා. එමගින් සෑම පාසලකම ප්‍රතිඵල අධීක්ෂණය කළ හැකියි. එමෙන්ම සෑම පන්ති කාමරයකම අඩු පාඩු සහ ප්‍රතිඵල පරීක්ෂා කරන්නට හැකියාව තිබෙනවා.

විදුහල්පතිවරයෙකුට තමන්ගේ පාසල හසුරුවන්නට බැරි නම් හොඳ අධ්‍යාපනයක් ලබාදීමට බැරි නම් ඒ විදුහල්පතිවරයා මාරු කරන්නට සිදු වනවා. එම අංශ ප්‍රධානියා ඉවත් කරන්නට සිදු වනවා. ගුරුවරුන් හොඳ අධ්‍යාපනයක් ලබා දෙන්නේ නැතිනම් ඒ පිළිබඳව හේතු සොයන්නට සිදු වෙනවා. එමෙන්ම ගුරුවරුන්ට වසරකට දින දෙකක් පාසලෙන් පිටවී ගුරු පුහුණුව සඳහා පිහිටුවන මධ්‍යස්ථානයට පැමිණ තමන් උගන්වන විෂයන් පිළිබඳ දැනුම අලුත් කර ගැනීමට අවස්ථාව ලබා දෙනවා. වසර 5 ක් 6 ක් ගත වූ පසුව දැනුම අලුත් කර ගැනීම සඳහා ගුරුවරුන්ට වසරකට දින 5 ක් පමණ වෙන් කිරීමට හැකියාව ලැබේවී.

ගුරුවරයා හෝ ගුරුවරිය සිසුනට අධ්‍යාපනය ලබාදීමට පෙර තමන්ගේ දැනුම විටින් විට අලුත් කර ගත යුතුයි. ලෝකයේ දියුණු රටවල තිබෙන ක්‍රමයත් එයයි. ලෝකයේ ප්‍රධාන රටවල් බොහෝමයක පවතින අධ්‍යාපන ක්‍රමයට අනුව එරට සාමාන්‍ය පෙළ විභාගයක් නැහැ. එරට පාසල්වලින් පාසලේ සිට සමාජයට යන අධ්‍යාපනයක් ලබා දෙනවා. මෙවැනි ක්‍රමයක් ඇති කරනවා නම් එහි පාලන වැඩ කටයුතු කළ යුත්තේ අධ්‍යාපන අමාත්‍යාංශය නොවේ. අප ව්‍යවස්ථාව අනුව එම වැඩකටයුත්ත පැවරෙන්නේ පළාත් සභාවටයි.

අධ්‍යාපන අමාත්‍යාංශය අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනය කරනවා. විෂය මාලා හදනවා. ගුරු පුහුණුවීම් ලබා දෙනවා. විෂය මාලා ක්‍රියාත්මකවීම පිළිබඳ සලකා බලනවා. ඒ සඳහා වෙනම පරීක්ෂණ කණ්ඩායමක් පත් කර ඒ අයගේ වාර්තා අනුව අප පළාත් පාසල්වලින් කරුණු විමසනවා. ජාතික පාසල් සහ පෞද්ගලික පාසල් හැර ඒ ඒ පළාතේ පාසල් පාලනය පළාත් සභාවට ලබා දෙනවා. පාසලේ එදිනදා වැඩකටයුතු විදුහල්පති විසින් බලා ගත යුතුයි. පාසල් මණ්ඩලයෙන් අනුමත කරන ලද සංවර්ධන සැලැස්මක් අනුව එම වැඩ කටයුතු සිදු කළ යුතුයි.

වාර්ෂික අධ්‍යාපන සැලසුම් ජාතික අධ්‍යාපන අමාත්‍යාංශයෙන් සහ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් සැකසෙනවා. එමෙන්ම විශේෂ අධ්‍යාපන වැඩසටහනක් දැන් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් සකස් කරමින් සිටිනවා. එම වැඩ පිළිවෙළ අධ්‍යාපන අමාත්‍යාංශයට තනිවම ක්‍රියාත්මක කරන්නට බැහැ. අපගේ ව්‍යවස්ථාව අනුව අධ්‍යාපනය සම්බන්ධ බලතල ගණනාවක් පළාත් සභාවට ලබා දී තිබෙනවා. මා අධ්‍යාපන අමාත්‍යවරයා වශයෙන් සිටින සමයේදී එම කෙටුම් පත් සකස් කළා. එම නිසා මෙම

සැලසුම කෙටුම්පතක් ලෙස සකසා පළාත් අධ්‍යාපන අමාත්‍යවරුන්, පළාත් අධ්‍යාපන ලේකම්වරුන් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් සමග මේ පිළිබඳව සාකච්ඡා කළ යුතුයි. එයින් එකඟත්වයකට පැමිණි පසුව පාර්ලිමේන්තුවේ තේරීම්කාරක සභාවට ඉදිරිපත් කර ඔවුන්ගේ අදහස් ද ලබා ගෙන කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කොට කැබිනට් මණ්ඩලයෙන් අනුමැතිය ලැබුණු පසුව නව කෙටුම් පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ හැකියි.

මේ සියලු දේ සිදු කිරීම සඳහා මුදල් අවශ්‍යයි. මේ සඳහා වැය වන මුදල කොපමණ දැයි යන්න ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය සහ භාණ්ඩාගාරය සමග සාකච්ඡා කරනවා. අප මුදල් වැය කළ යුත්තේ ඒ සඳහායි. අප ජාතික ධනය වැය කරන්නේ අනාගත පරපුර සඳහා හොඳ අධ්‍යාපනයක් ලබා ගැනීමටයි. ජනාධිපතිවරණයේදී මෛත්‍රීපාල සිරිසේන මහතාත් ඒ පිළිබඳව පොරොන්දුවක් ලබා දී තිබෙනවා. එමෙන්ම ජාතික ආණ්ඩුවේ තිබෙන පක්ෂත් ඊට පොරොන්දු ලබාදී තිබෙනවා. ඒ මුදල් ලබාගෙන අධ්‍යාපනය ඉදිරියට ගෙන යාමට කටයුතු කරනවා. අප මේ දිනවල සාකච්ඡා කරමින් සිටින්නේ එම නව ක්‍රමවේදය ස්ථාපිත කිරීම සඳහායි.

අධ්‍යාපනයට අප වැඩිපුර මුදල් වැය කරනවා නම් ඒ සඳහා ආදායම සොයා ගන්නවා නම් වැඩි කල් යාමට පෙර අපට ශීඝ්‍ර ආර්ථික දියුණුවක් ලබා ගැනීමට ද හැකියාව ලැබෙනවා. ශීඝ්‍ර ආර්ථික දියුණුවක් ලැබුණු පසුව අධ්‍යාපනය මෙන් සෞඛ්‍යයට ද වැඩිපුර මුදල් ලැබෙනවා. අප ක්‍රියාත්මක කරන්නේ ඒ වැඩපිළිවෙළයි. මීට පෙර එම වැඩසටහන ක්‍රියාත්මක නොකළේ ඇයි දැයි ඇතැමුන් විමසනවා. අපේ රටේ ආර්ථිකයේත්, ගෝලීය ආර්ථිකයේත් අස්ථාවර බවක් තිබුණා. ඒ අස්ථාවර බව දැන් අප සකස් කර තිබෙනවා. ඒ පිළිබඳව දැන් ප්‍රශ්නයක් නැහැ. අපට ඉදිරියට ගමන් කිරීමට හැකියාව තිබෙනවා.

එක් අතකින් ආර්ථිකය සංවර්ධනය කිරීමට, අධ්‍යාපනය සඳහා වියදම් කිරීමට, අධ්‍යාපනය ලබන සිසුන් උසස් අධ්‍යාපනය සඳහා යොමු කිරීමට මෙන්ම කාර්මික පුහුණුව සඳහා යොමු කිරීමටත් මුදල් අවශ්‍යයි. එම අධ්‍යාපනය ලැබුණු පසු අප රැකියා ලබා දිය යුතුයි. ශීඝ්‍ර ආර්ථික සංවර්ධනය සහ අධ්‍යාපනයේ දියුණුව අත්වැල් බැදගෙන ඉදිරියට යන යුගයක් අප නිර්මාණය කරනවා. අපගේ අධ්‍යාපන වැඩ සටහන් සැකසීම සඳහා විදුහල්පතිවරුන්ට මෙන්ම ගුරුවරුන්ටත් අදහස් ලබාදීමේ හැකියාව තිබෙනවා. අපගේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටත්, වසර 13 ක අනිවාර්ය අධ්‍යාපනය ලබා දීමටත් සැමගේ සහයෝගය අපේක්ෂා කරනවා.

*එහිදී අදහස් දැක්වූ අධ්‍යාපන අමාත්‍ය අකිල විරාජ් කාරියවසම් මහතා.*

වසර 71 ක් පැරණි මෙම පාසැල කීර්තිමත් කාන්තාවන් බොහෝ දෙනෙක් රටට දායාද කර තිබෙනවා. සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර හා සර් රාසික් ෆරීඩ් යන මහත්වරුන් මෙම පාසල ආරම්භ කිරීමට කටයුතු කළා. ඉදිරි ලෝකයට ගැලපෙන්නා වූ අධ්‍යාපන ක්‍රමයක් සකස් කරන බව දැනට අධ්‍යාපනය පිළිබඳ මනා දැනුමක් ඇති අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා අද දින පැහැදිලි කළා. අධ්‍යාපන ඇමැතිවරයා වශයෙන් මම අද දින ඒ පිළිබඳ ආඩම්බර වනවා.

අපේ අරමුණ කිසිදු දේශපාලනීකරණයකින් තොරව අධ්‍යාපනය ඉදිරියට ගෙන යාමයි. අධ්‍යාපනය යනු අනාගතය සඳහා සුබ මාවත විවර කරන ගමන් බලපත්‍රයයි. මෙම පාසල ජාතික සංහිදියාව ඇති කිරීමට හොඳ අඩිතාලමක් දමා තිබෙනවා. මේ ජනාධිපතිවරයාගේ හා අග්‍රාමාත්‍යවරයාගේ ජාතික සමගිය ඇති කරන්නා වූ වැඩසටහනට ශක්තියක්. දරුවන්ගේ අනාගතය තීරණය වනුයේ ඔවුන්ගේ අධිෂ්ඨානය මතයි. එම අධිෂ්ඨානය ජය ගැනීම සඳහා අවශ්‍ය සියලුම පහසුකම් ලබාදීමට අධ්‍යාපන ඇමැතිවරයා වශයෙන් මා සූදානම් යැයි අධ්‍යාපන අමාත්‍යවරයා වැඩිදුරටත් පැවසීය.

මෙම උත්සවය සඳහා ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන රාජ්‍ය අමාත්‍ය ඒ.එච්.එම්. ෆවුසි, පාර්ලිමේන්තු මන්ත්‍රී මුජිබූ රහ්මාන් ඇතුළු මහත්ම මහත්මීහුද සහභාගී වූහ.